# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2024/45- 2017 ජුනි මස 23 වැනි සිකුරාදා - 2017.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### අධිකරණ සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 දෙසැම්බර් මස 08 වැනි දිනැති අංක 14 දරන ගැසට් පත්‍රයේ ආණ්ඩුවේ නිවේදන යටතේ පළ කර ඇති අධිකරණ සේවා කොමිෂන් සභා රීති වලට අදාළ II වන කොටසේ ඇති ''අධිකරණ නිලධරයන්ගේ පත්වීම්, උසස්වීම් සහ මාරු වීම්'' යටතේ 06 වන ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් ඉවත් කර, පහත සුදුසුකම් අදාළ විය යුතු බවට නියම කරනු ලැබේ.

**ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පන්තියේ I ශ්‍රේණිය (මහේස්ත්‍රාත්) තනතුර**

සුදුසුකම් -

අ. අවුරුදු දෙකකට නොඅඩු සේවා කාලයක් ඇති කම්කරු විනිශ්චය සභා සභාපතිවරයකු වීම, හෝ

ආ. අවුරුදු පහකට නොඅඩු කාලයක් ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටින හෝ යෙදී සිටි නීතිඥවරයකු වීම, හෝ

ඇ. යම් අමාත්‍යාංශයක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක අවුරුදු පහකට නොඅඩු කාලයක් නීති නිලධරයකු ලෙස සේවය කර ඇති නීතිඥවරයකු වීම, හෝ

ඈ. යම් සමාගමක හෝ බැංකුවක හෝ ආයතනයක නීති නිලධරයකු ලෙස අවුරුදු පහකට නොඅඩු කාලයක් සේවය කර ඇති සහ එම කාලය තුළ නිරතුරුවම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයකු වීම

**කම්කරු විනිශ්චයාධිකාරී සභාපති II ශ්‍රේණිය තනතුර**

සුදුසුකම් -

අ. අවුරුදු පහකට නොඅඩු කාලයක් ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටින හෝ යෙදී සිටි නීතිඥවරයකු වීම, හෝ

ආ. යම් අමාත්‍යාංශයක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක අවුරුදු පහකට නොඅඩු කාලයක් නීති නිලධරයකු ලෙස සේවය කර ඇති නීතිඥවරයකු වීම, හෝ

ඇ. යම් සමාගමක හෝ බැංකුවක හෝ ආයතනයක නීති නිලධරයකු ලෙස අවුරුදු පහකට නොඅඩු කාලයක් සේවය කර ඇති සහ එම කාලය තුළ නිරතුරුවම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයකු වීම

ජේ. එම්. ඩබ්. පී. ජයතිලක,
*වැඩබලන ලේකම්,*
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2017 ජුනි මස 22 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

07 - 207

1A - G 25780 — 10 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*